# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2021.09.15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 අගෝස්තු

**2021 අගෝස්තු මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.**

**2021 අගෝස්තු මාසයේදී COVID-19 වසංගතය නැවත හිස එසවීම හේතුවෙන් රටේ නිෂ්පාදන ක්‍රියාකාරකම් පහළ යන ලදී.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව 2021 අගෝස්තු මාසයේදී දර්ශකාංක 12.7 කින් පහළ යමින් 45.1 ක් ලෙස වාර්තා වූ අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් උප දර්ශක වල සිදුවූ පහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

විශේෂයෙන් ආහාර හා පාන වර්ග, ගෘහ භාණ්ඩ සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයන්හි නව ඇණවුම් සහ නිෂ්පාදන වල දක්නට ලැබුණු පහළ යාම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සමස්ත පහළ යාමට හේතු විය. වසංගතය පාලනය කිරීමේ පියවරක් ලෙස පනවා තිබූ සංචරණ සීමා හේතුවෙන් තම දේශීය ඇණවුම් සහ බෙදා හැරීමේ මාර්ග කෙරෙහි බලපෑම් එල්ල වූ බව එම අංශවල සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී. තවද, සේවකයින් අතර වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් කර්මාන්ත ශාලා මෙහෙයුම් කටයුතු වලට බදා එල්ල වූ බව ද බොහෝ දෙනෙක් අවධාරණය කළහ. මෙම කරුණු හේතුකොටගෙන සේවා නියුක්තිය උප දර්ශකය ද පහළ යන ලදී.

| විචල්‍යය | ජූලි | අගෝ | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **57.8** | **45.1** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 61.5 | 42.6 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 54.0 | 37.8 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.0 | 44.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 51.0 | 43.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 69.0 | 64.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන පහත වැටීමට සමගාමීව තොග මිලදී ගැනුම් ද අඩු විය. තවද, අමුද්‍රව්‍ය ඇණවුම් කිරීමේදී සහ විදේශීය ගෙවීම් පියවීමේදී මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා ද අමුද්‍රව්‍ය සැපයුම් දාමයට හා නිෂ්පාදන සැලසුම්කරන ක්‍රියාවලියට අහිතකර ලෙස බලපාන ලදී. ආනයනික අමුද්‍රව්‍යවල මිල අඛණ්ඩව ඉහළ යාම තම ලාභ ආන්තිකයට අහිතකර ලෙස බලපෑ බව ප්‍රතිචාර දැක්වූවන් බොහෝ දෙනෙක් අවධාරණය කළහ. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 අගෝස්තු මාසයේදී අඩු වේගයකින් ඉහළ යන ලදී.


COVID-19 වසංගතයේ ව්‍යාප්තිය සමඟ ඇතිවූ අවිනිශ්චිතතාවය හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත කටයුතුවලට විය හැකි බාධාවන් පිළිබඳව නිෂ්පාදකයින් දැඩි අවධානයෙන් පසු වන නමුත් ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත අපේක්ෂාවන් තව දුරටත් කඩයිම් මට්ටමෙන් ඉහළ අගයක් වාර්තා කරන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**45.1**

**2021 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 12.7කා පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.3 කින් පහළ යමින් 2021 අගෝස්තු මාසයේදී 54.1ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 අගෝස්තු මාසයේදී ඉන්දියාව, එක්සත් ජනපදය, යුරෝපා කලාපය සහ එක්සත් රාජධානියෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී. මේ අතර, චීනයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය කඩයිම් මට්ටමට වඩා පහළ ගිය අතර, රුසියාවේ එම දර්ශකය තව දුරටත් පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 සැප්තැම්බර් 14වන දිනට*

[1] *මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**COVID-19 වසංගතය තවදුරටත් ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා පැන වූ සීමා සමඟ සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 අගෝස්තු මාසයේ දී 46.2ක දර්ශක අගයක් දක්වා පහළ ගියේය.** නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශක පහළ යෑම් වාර්තා කරන ලදී.

ප්‍රධාන වශයෙන්, තොග සහ සිල්ලර වෙළඳාම, රක්ෂණ, දේපළ වෙළඳාම සහ අධ්‍යාපන යන උපඅංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ නව ව්‍යාපාර උප දර්ශකය පසුගිය මාසය හා සසඳන විට අගෝස්තු මාසයේ දී පහළ ගියේය.

සංචරණ සීමා හේතුවෙන් ව්‍යාපාර කටයුතු කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම් පෙන්නුම් කරමින් තොග සහ සිල්ලර වෙළඳාම, දේපළ වෙළඳාම, රක්ෂණ සහ අනෙකුත් පෞද්ගලික සේවා වැනි බොහෝ උප අංශ වල ව්‍යාපාර ක්‍රියාකාරකම් සැලකිය යුතු පහත වැටීම් වාර්තා කළේය. කෙසේ වුවද, භාණ්ඩ ප්‍රවාහන ධාරිතා ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උප අංශය වර්ධනයක් වාර්තා කළේය. තවද, සංචරණ සීමා හේතුවෙන් ඇති බාධා මධ්‍යයේ වුවද මූල්‍ය සේවා උප අංශය වැඩිදියුණු වීම් පෙන්නුම් කරන ලදී.

අගෝස්තු මාසය තුළ සිදු කරන ලද නව බඳවා ගැනීම් සංඛ්‍යාව ඉක්මවා විශ්‍රාම යෑම් සහ ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත්වීම් සංඛ්‍යාව ඉහළ යෑම හේතුවෙන් සේවා නියුක්තිය වැඩි වේගයකින් අඛණ්ඩව පහළ ගියේය.

සංචරණ සීමා සහ COVID-19 ආසාදිත කාර්ය මණ්ඩල සාමාජිකයන් වැඩි වීම මධ්‍යයේ රැකියා කටයුතු සිදු කල හැකි කාර්ය මණ්ඩලය අඩු වීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් අගෝස්තු මාසයේ දී වැඩි වේගයකින් ඉහළ යන ලදී.

| විචලයය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **55.7** | **46.2** | **-** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 58.6 | 40.2 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.5 | 35.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.0 | 47.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 53.2 | 60.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 54.5 | 47.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් අඛණ්ඩව මාස දෙකක් ඉහළ යෑමෙන් අනතුරුව, සංචරණ සීමා දීර්ඝ කිරීම සහ ආනයන සීමා කිරීම් හා එමගින් ව්‍යාපාර කටයුතු කෙරෙහි ඇති අහිතකර බලපෑම් මධ්‍යයේ අගෝස්තු මාසයේ දී පහත වැටුණි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**46.2**

**2021 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 9.5ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

මාස හතක් තුළ වාර්තා වූ අවම අගය වාර්තා කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 ජූලි මාසයේ පැවති 56.3 සිට 2021 අගෝස්තු මාසයේ දී 52.9 දක්වා තියුණු ලෙස පහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 අගෝස්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, චීනය සහ ජපානය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 සැප්තැම්බර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචලයයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචලයයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.